# සංහිඳියාව හා සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
# ශ්‍රී ලංකාව, 2017

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාව, රටේ සියළුම ප්‍රජාවන්ට හා ජනතාවට හානි කළ හා පීඩා ගෙන දුන් දශක තුනක යුද්ධයකින් පීඩා විඳ ඇත. මෙම අවිගත් නැගිටීම 2009 වසරේදී අවසන් වූයේ රටේ ප්‍රජාවන් අතර ඇති විශ්වාසය හා සබඳතාවයන් බිඳ දමමින් ඔවුන් අතර නොඉවසීම හා වැරදි වටහාගැනීම් ගණනාවක් ඉතිරි කරමිනි.

*2015* වසරේදී ශ්‍රී ලංකා රජය සංහිඳියාව සඳහා වන තම කැපවීමට නවමු මුහුණුවරක් ගෙන දුන් අතර ජාතික සංහිඳියාව සඳහා මූලාරම්භයන් ගණනාවක්ම දියත් කරන ලදී. කෙසේ වෙතත්, සංහිඳියාව පිළිබඳව අවධාරණය කෙරෙන විස්තීර්ණ වූ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවයක් තවමත් පවතින අතර මෙම ප්‍රතිපත්තියෙන් එම අරමුණ සාක්ෂාත් කරගැනීමට අදහස් කෙරේ.

## 2. පූර්විකාව

*දශක තුනක් තිස්සේ පැවති අවිගත් ගැටුමද ඇතුළුව දිගුකාලීනව පැවති සමාජ හා දේශපාලන අසහනයෙන් ශ්‍රී ලංකාවේ සියළුම පුරවැසියන්ගේ ජීවිතවලට, ගරුත්වයට හා ආරක්ෂාවට සිදුවූ පීඩාව, හානිය හා විනාශය **සැලකිල්ලට ගනිමින්;***

*ගැටුම අවසන් වූ දා සිට ප්‍රජාවන් තුළ හා අතර වන විශ්වාසයේ පළුදු වීම්, එකිනෙකා නොඉවසීම් හා වැරදි වටහාගැනීම් පවතින බව **පිළිගනිමින්;***

*ප්‍රශ්නයේ සැබෑ හේතුව වන්නේ රට තුළ සිටින සියළුම ප්‍රජාවන් තෘප්තියට පත් කරන සහයෝගී දේශපාලන අධිකාරියක් සඳහා වන පිළිගත හැකි සැලසුමක් නොමැති වීම බව හා එය මෙරට ඉතිහාසය පුරා විවිධ කාල සීමාවන් තුළ ඇති වූ අසහනය හා ප්‍රචණ්ඩත්වය මගින් ප්‍රකාශයට පත්වූ බව **සිහි තබාගනිමින් ;***

*අධ්‍යාපනය, ජීවනෝපාය, රැකියාව හා යුක්තිය ද ඇතුළුව එහෙත් එයට සීමා නොවූ විවිධ ක්ෂේත්‍රයන් වෙත සමාන ලෙස පිවිසීමට ඇති අවස්ථාවේ ඌණතාවය රටේ අසහනයට ප්‍රධාන හේතුවක් බව **අවබෝධ කරගනිමින්;***

සිවිල් පරිපාලනය ශක්තිමත් කිරීම, දේපළ හා ඉඩම් නිසි හිමිකරුවන්ට නැවත භාරදීම; *මාධ්‍ය* නිදහස ප්‍රවර්ධනය කිරීම, ජීවනෝපාය මාර්ග අවස්ථා ජනනය කිරීම; අතුරුදන් වූ පුද්ගලයන්ගේ හා ඔවුන්ගේ ඥාතීන්ගේ හිමිකම් හා අභිලාශයන් ආරක්ෂා කිරීම යනාදී වූ ක්‍රියාමාර්ගයන්ද ඇතුළුව එහෙත් ඒවාට පමණක් සීමා නොවී තවත් ක්‍රියාමාර්ගයන් ගණනාවක් තුළින් රජය හා පුරවැසියා අතර යහපත් සම්බන්ධතාවය යළි ස්ථාපිත කිරීමේ අපේක්ෂාවෙන්;

*ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ශක්තිමත් කරමින්; ප්‍රතිපත්ති, නීති, අධ්‍යාපනය හා භාවිතය තුළින් විවිධත්වය හා සංස්කෘතික බහුවිධතාවය පිළිගනිමින් හා භාෂාව සහ සංස්කෘතික උරුමය සඳහා පුද්ගලයන්ට ඇති අයිතියට ගරුකරමින්; සංවාදය, විනිශ්චය හා කොන් කිරීම් සහ ගැටුම් නැවත ඇති වීම වැළැක්වීමට අදාල ක්‍රියාමාර්ගයන් තුළින් සියලුම ශ්‍රී ලාංකිකයන්ට එකමුතුකම පිළිබඳ ශක්තිමත් හැඟීමක් ඇතිකිරීම සඳහා ජාතිකත්වය පිළිබඳ අදහස ඇති කරමින් ජාතික සංහිඳියාව බලවත් කිරීමට සවිඥානික වෑයමක් දරන බවට* ***සහතික වෙමින්;***

*භාෂා නීතිය සඳහා ව්‍යවස්ථාමය තත්ත්වයක් ලැබීම සහ ජාතික ත්‍රෛභාෂා ප්‍රතිපත්තියට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීම පසුබිම් කරගෙන භාෂා ප්‍රතිපත්තිය හා සම්බන්ධව ඇති ජාතික ඒකමතිකභාවය පිළිබඳව* ***සවිඥානිකව;***

*රාජ්‍ය හා පුද්ගලික අංශය සහ පුරවැසියන් අතර හා රට පුරාම පුළුල් වශයෙන් භාෂා ප්‍රතිපත්තිය හා නීතිය ක්‍රියාත්මක කිරීමේ* ***අධිෂ්ඨානයෙන්;***

*ජාතික සහජීවනය හා සංහිඳියාව සඳහා වන පූර්විකාවක් වශයෙන් භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* ***හඳුනාගනිමින්;***

*වරදට දඬුවම් නොලබා සිටීමට එරෙහිව අරගල කරමින් හා නීතියේ ආධිපත්‍යය ඔසවා තබමින් එක් අතකින් සිවිල් හා දේශපාලන අයිතීන්ද අනෙක් අතින් ආර්ථික සමාජ හා සංස්කෘතික අයිතීන්ද ඇතුළුව සියළුම පුරවැසියන්ගේ මානව අයිතීන්වලට ගරු කිරීමට හා ආරක්ෂා කිරීමේ* ***අධිෂ්ඨාන පෙරදැරිව;***

*ගැටුම් හා ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන්ට පුද්ගලානුබද්ධ ලෙසත් ප්‍රජාවන් හා සමාජමය මට්ටමිනුත් යන ආකාර ද්වයයෙන්ම සුවවීමේ ක්‍රියාවලිය සාකල්‍ය ලෙස සිදු කෙරෙන බවට* ***තහවුරු කෙරෙමින්;***

ශ්‍රී ලංකාවේ සියළුම ප්‍රජාවන්ට අදාල වෙන අයුරින් ජාතික ආඛ්‍යානයක් ගොඩනැගීමේ වැදගත්කම පිළිබඳව සලකා බලමින්;

සියල්ල ඇතුළත් තමන් අයිති බව හැඟෙන සමාජයක් සහ සෑම ශ්‍රී ලාංකීය පුරවැසියෙකුගේම විභවයන් පූර්ණ ලෙස පිළිගන්නාවූ පරිසරයක් නිර්මාණය කිරීමේ ලා කැපවෙමින්;

රජයේ පූර්ණ උත්සාහයන් හා පසුගිය සිද්ධීන් නැවත සිදු නොවෙන බවට සහතික කිරීම හා සංහිඳියාව සඳහා අනාගතවාදී මූලාරම්භයන් තුළින් යන දෙආකාර වූ එළඹුමක් සහිත බහු පාර්ශ්වකාර ක්‍රියාවලියක් සඳහා කැඳවුම් කරමින් ;

ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, භාෂාව හා සංස්කෘතික උරුමයට ඇති අයිතියද ඇතුලත්ව මානව හිමිකම්, නීතියේ ආධිපත්‍යය, ජාතික එක්සත්බව හා විවිධත්වය පිළිගන්නා ප්‍රජා සහජීවනය යන කරුණු මත මෙම සංහිඳියාව හා සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රතිස්ථාපනය කෙරේ.

## 3. අරමුණු

1. සංහිඳියාව හා සහජීවනය සම්බන්ධව රාජ්‍ය ප්‍රතිපත්තිය ලෙස ක්‍රියාත්මක වීම
2. පසුගිය ප්‍රචණ්ඩත්වයන් හා ගැටුම් සඳහා පිළියම් සොයමින් හා රටේ සියළුම ජනතාවන්ගේ හා ප්‍රජාවගේ ජාතික එකමුතුව සහ සාමකාමී සහජීවනය ඇති කරන සහයෝගී අනාගතයක් අපේක්ෂාවෙන් ජාතික සංහිඳියාව හා සහජීවනය සඳහා මග පෙන්වීම
3. සාමය හා ජාතික එකමුතුව යන මූලාරම්භයන්ගේ සමායෝජනය ඇතිකිරීම සඳහා සංහිඳියාව හා සහජීවනය වෙනුවෙන් කටයුතු කරන සියළු පාර්ශ්වකරුවන්ට මාර්ගෝපදේශ රාමුවක් සැකසීම

## 4. සාධාරණීකරණය

- ශ්‍රී ලංකාවේ සියළුම ප්‍රජාවන්ට තත් කාලීන නොවන හා වරින් වර සිදු නොවන අනුකලිත, සාකල්‍ය හා විස්තීර්ණ ප්‍රතිචාරයක් අවශ්‍යය.
- සාමය හා ජාතික එක්සත්බව පිළිබඳ මූලාරම්භයන් සැකසෙමින් පවතින නමුත් මේ සම්බන්ධව ශ්‍රී ලංකා රජයට ප්‍රකාශිත හා නිශ්චිත ප්‍රතිපත්තියක් නැත; එබැවින් සංහිඳියාව හා සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය එම හිඩැස පුරවනු ඇත.
- විවිධ පාර්ශ්වකරුවන් විසින් මෙම ක්‍රියාවලිය සඳහා සකසන සියලුම සාමය හා ජාතික එක්සත් බව පිළිබඳ මූලාරම්භයන් සැලසුම් කිරීමේ හා සංවර්ධනය කිරීමේ කටයුතුවල අනුරූපීතාවයක් හා ගැලපීමක් ඇතිකිරීම අවශ්‍යව ඇත.

- ශ්‍රී ලංකාවේ රජය හා ජනතාව අතර සහයෝගී දැක්මක් ඇති කරගැනීමේ වැදගත්කම පිළිබඳව දැනුවත්ව සංහිඳියාව හා ජාතික සහජීවනය සම්බන්ධව ක්‍රියා කරන සියළු හවුල් කරුවන් අතර ඒකමතිකභාවයක් ඇති කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරනු ඇත.

## 5. ප්‍රතිපත්ති මූලධර්ම

නීති සහ උපදෙස් මාලා සම්පාදනයෙහි ලා පදනම සකස් කරනු ලබන ක්‍රියාකාරී විය හැකි මූලධර්ම සහ දීර්ඝ - කාලීන ඉලක්ක මාලාවක් සහ ජාතික සංහිඳියාව සහ සහජීවනය සඳහා සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම පිණිස නීති සහ උපදෙස් මාලා සකස් කිරීම.

**සමානාත්මතාව**

- සියලු ජාතික ප්‍රතිපත්තීන් හි, නීතීන් හි, සහ ක්‍රියාවන් හි අත්‍යවශ්‍ය වූවක් ලෙස සාමය හා සමානාත්මතාවෙහි අගයන් පාලනයකින් යුතුව අනුගත කර ගැනීම.

- සංහිඳියාව සඳහා වන අත්‍යවශ්‍ය සාධකයක් ලෙස සියලු ප්‍රජාවන්හි දුක් ගැනවිලි සහ අපේක්ෂාවන් වලට සවන් දෙනු ඇති දේශපාලනික එකඟතාවක් කරා ලඟා වීමේ ක්‍රමයක් ලෙස බලය බෙදාගැනීමේ මූලධර්මය පිළිගැනීම.

- රටේ සියලු ජනතාව සහ ප්‍රජාවන් සඳහා සේවාවන්ට සහ අවස්ථාවන්ට සමාන ප්‍රවේශයන් ලැබීම තහවුරු කිරීම.

- සියලු ජාතික මූලිකාංගයන්හි පුම්තිරිබවෙහි සාමානාත්මතාව සහතික කිරීම; රට පුරා අවදානම් මට්ටමෙහි සිටින කාන්තාවන් සඳහා ආරක්ෂක යාන්ත්‍රණයක් සකස් කිරීම; ප්‍රචණ්ඩත්වය දරා සිටින ලද කාන්තාවන් වෙත පිළියම් සැපයීම සහ වන්දි ලබාදීම; සහ තීරණ - ගන්නා පාර්ශවකරුවන් සහ සංහිඳියා ක්‍රියාවලීන් සහ කටයුතු වලදී වෙනස් වීමේ නියෝජිතයන් ලෙස කාන්තාවන්ගේ ආයතන ප්‍රවර්ධනය කිරීම

- සැකයෙන් තොර පහත් කොට නොසලකන, විනිවිදභාවයෙන් යුත් භාවය ප්‍රවර්ධනය කරන්නාවූ ජාතික, පලාත් සහ පලාත් පාලන මට්ටම් වලදී සියලු නෛතික, සමාජයීය, දේශපාලනික සහ පරිපාලනමය යාන්ත්‍රණ වල සියලු පුරවැසියන් වෙත සමාන ප්‍රවේශය ඔවුන්ගේ ස්වාධීන නිදහසට ප්‍රවේශ වීමේ හැකියාව සහතික කිරීම.

**මානව හිමිකම්**

- කිසිවෙකුටත් පහත් කොට සැලකීමකින් තොරව රටෙහි සියලු පුරවැසියන් සහ පුද්ගල කණ්ඩායම් සඳහා සම්පූර්ණ සිවිල් හා දේශපාලනික හිමිකම් සමානව ලබාදෙන බවට සහතික වීමට රජය විසින් සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතු වේ. රජය විසින් සිවිල් සහ දේශපාලනික හිමිකම්

20/46

පැනවීම සඳහා යාන්ත්‍රණයක් ලබාදිය යුතු වන අතර නීතියේ අධි පාලනය / රජයුම, පරිපාලන යුක්තිය, පරීක්ෂා කිරීම් සහ තුලනය කිරීම් වලින් යුතු වූ හිමිකම් සංස්කෘතියක් ද ප්‍රජාතාන්ත්‍රවාදී ව්‍යුහයන්ද සකස් කිරීමට අධ්‍යාපනික ක්‍රියාමාර්ග ගැනීම සඳහා පද්ධතියට ශක්‍යතාවක් ඇති කළ යුතුය. මෙම හිමිකම් ක්‍රියාත්මක කිරීම සහතික කරනු වස් වැදගත් භූමිකාවක් අධිකරණ පද්ධතිය මගින් ඉටුකළ යුතුය.

- ගරු කිරීමට, ආර්ථික, සමාජයීය සහ පවත්නා සම්පත් උපරිමයෙන් භාවිතා කිරීම තුලින් සංස්කෘතික හිමිකම් ආරක්ෂා කිරීමට සහ සාක්ෂාත් කිරීමට බැඳීම් ද ඇතුළුව චර්යාත්මක සහ ප්‍රතිඵලාත්මක බැඳීම් රජය සතුව ඇත. මෙකී හිමිකම් ක්‍රියාත්මක වන බවට සහතික වීම පිණිස අධිකරණ පද්ධතිය වැදගත් කාර්යභාරයක් ඉටු කළ යුතුව ඇත.

- සෑම පුද්ගලයකුගේම අභිමානයට ගරු කෙරෙන පරිදි හිමිකම් රකිමින් සෑම පුරවැසියකුගේම අභිමානය සුරැකීම. මානව අභිමානයට ගරු කිරීම යනු හුදෙක්ම එක් එක් මානවයාගේ ජීවිතයට ගරු කිරීමයි. තනි පුද්ගල සහ ජාතික වශයෙන් පුද්ගලයන් ලෙස සහ සාමූහික ක්‍රියාකාරීත්වයක් ලෙස අභිමානය ප්‍රකෘතිමත් / යථාවත් කිරීම අවශ්‍යතාවක් වන්නේය.

**වාග් විද්‍යාත්මක හිමිකම්**

- **රාජ්‍ය යාන්ත්‍රණය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයෙහි 18 සිට 25 වන දක්වා වූ භාෂා ප්‍රතිපත්තියට අයත් කොටස් මගින් බැඳී සිටිනු ඇති අතර ජාතික ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය මගින් සිංහල සහ දමිල භාෂාවන් රාජ්‍ය භාෂා ලෙසද ඉංග්‍රීසි සංධාන භාෂාව ලෙසද පිළිගෙන අමාත්‍ය මණ්ඩලයෙහි අනුමැතිය ලබාගෙන ඇත.**

- රාජ්‍ය යාන්ත්‍රණය විසින් සිංහල භාෂාව පරිපාලන භාෂාව ලෙස භාවිතා කරමින් පොදු වාර්තා සහ දමිල භාෂාව භාවිතා කරනු ඇති උතුරු සහ නැගෙනහිර පලාත් වල හැර ශ්‍රී ලංකාවෙහි සියලු පලාත් වල සියලු රාජ්‍ය ආයතනයන්හි සියලු ව්‍යාපාර කටයුතු ද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි IV වන පරිච්ඡේදයෙහි 22 (1) වන කොටස අනුව භාවිතා කළ යුතුය.

- ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ද්වි භාෂික ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ස්ථාපිත කිරීම සහ ව්‍යවස්ථාදායක ප්‍රතිපාදන පිළිබඳව රාජ්‍යය විසින් දැනුවත් වී එනම් ජනාධිපතිවරයා විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කොට්ඨාශයක ඕනෑම ඒකකයකට අයත් සිංහල හෝ දමිල භාෂාව කතාකරන සුළු ජනගහනය අනුව ප්‍රාමාණිකව සලකා බලා, එකී ප්‍රදේශයෙහි සමස්ත ජනගහනය මත පදනම්ව, සිංහල සහ දමිල හෝ එකී ප්‍රදේශය පවත්නා පලාතේ පරිපාලන භාෂාව ලෙස භාවිතා වන වෙනත් භාෂාවක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයෙහි 22 (1) කොටස අනුව එකී ප්‍රදේශය සඳහා පරිපාලන භාෂාව ලෙස යොදාගනු ඇත.

- **වර්තමාන ජාතික සම්මුතිය මත රාජ්‍යය විසින් භාෂා ප්‍රතිපත්තිය සහ නීතිය පිළිබඳ හොඳම අස්වැන්න නෙලා ගත යුතු අතර ජාතික සහජීවනය සහ සංහිඳියාව සඳහා පූර්විකාව වශයෙන් භාෂා ප්‍රතිපත්තිය සහ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා උද්‍යෝගීමත් කළ යුතුය.**

- මධ්‍යම රජයේ, පලාත් රජයේ හෝ පලාත් පාලන ව්‍යුහයේ හෝ වේවා සියලු රාජ්‍ය ආයතනයන්හි සිය කැමැත්තට අනුව සියලු පුරවැසියන්ට ඔහුගේ හෝ ඇයගේ අභිමතය පරිදි ඕනෑම රාජ්‍ය භාෂාවක් හෝ සංධාන භාෂාව හරහා ලිඛිත හෝ වාචික ප්‍රතිචාර ලැබීමේ තත්ත්වයන් ඇති කිරීමට නෛතිකව සහ ප්‍රතිපත්තිමය වශයෙන් රජයට බැඳීමක් ඇත.

- සියලු රාජ්‍ය ආයතනයන් හි බාහිර සහ අභ්‍යන්තර සංඥා පුවරු සහ මහජනතාව විසින් භාවිතා කරනු ලබන ආකෘතිපත් ඒවා රජයේ වුවද, පලාත් රජයේ වුවද, පලාත් පාලන ආයතනයන්හි වුවද, භාෂා ත්‍රිත්ත්වයෙන්ම ප්‍රදර්ශනය කිරීමේ වගකීම නීතිමය වශයෙන්ද ප්‍රතිපත්තිමය වශයෙන්ද රජය සතු වේ.

- ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ සම්පාදිත පරිද්දෙන් රාජ්‍ය භාෂාව හා සන්ධාන භාෂාවන් අධිකරණයන්හි, ව්‍යවස්ථාදායක භාෂාවන්හි, අධිකරණ භාෂාවන්හි පාසල් වල උපදෙස් ලබා දෙන භාෂාවන්හි භාවිතා විය යුතු බවට රාජ්‍යයට බැඳීමක් පවතී.

**ජාතික සහජීවනය සහ විවිධත්වය**

- රජය විසින් සියලු දේශ හිතෛෂී බලවේග යලි පණගන්වා නෛතික, ප්‍රතිපත්තිමය සහ ආත්මීය වශයෙන් ශ්‍රී ලංකාව තුල සක්‍රීය පුරවැසිකත්වයක් ඇතිකරලීමේ අභිප්‍රාය වෙත ලඟාවිය යුතු අතර ශ්‍රී ලාංකිකයෙකු යනු කවුරුන් දැ යි යන්න ඒත්තු ගැන්වෙන පරිදි ශ්‍රී ලාංකේය අනන්‍යතාව හඳුනාගනිමින් ශ්‍රී ලාංකේයත්වය වර්ධනය කරමින් ජාතියෙහි විවිධත්වයෙන් හෙබි සංස්කෘතික සංකීර්ණත්වය සහ ශ්‍රී ලංකාව තුළ එකකට වඩා වැඩි ආගම්,භාෂා සහ වාර්ගිකත්වයක් පැවතීම ජාතික සහජීවනයෙහි මූලික පූර්ව අවශ්‍යතාවයක් ලෙස හඳුනාගැනීම.

- අතීතයෙහි සිදුවූ අමිහිරි සිදුවීම් යලි සිදු නොවීම සඳහා සංවාද, මැදහත්වීම් සහ ක්‍රියාකාරකම් හරහා සියලු ශ්‍රී ලාංකේය පුරවැසියන්ගේ එක්ව විසීම පිළිබඳ හැඟීම වඩාත් ශක්තිමත්ව ඇති කර ලීම සඳහා ශ්‍රී ලාංකේය ජාතිකත්වය පිළිබඳ හැඟීම සමාජ - දේශපාලනික වශයෙන් වර්ධනය කරන්නා වූ අතරතුර භාෂාව, ආගම, සහ සංස්කෘතික උරුමයන් වෙත පුද්ගලයන්ට ඇති හිමිකම සහතික කරනු වස් පුරවැසියන් සහ රාජ්‍ය යාන්ත්‍රණය වෙත නායකත්වය සහ මගපෙන්වීම තදින්ම ලබා දීම රජය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් ද, නෛතික, අධ්‍යාපනික සහ පුරුද්දක් වශයෙන්ද සිදු කළ යුතුය.

- කොන් කරන ලද ප්‍රජාවන් හි දායකත්වය විධිමත්ව ලබා ගනිමින් ඔවුන් තීරණ ගැනීමේ මෙන්ම අවස්ථා සහ සේවාවන් සඳහා ප්‍රවේශ කරවමින් සක්‍රීයව දිරිමත් කිරීමට අවැසි යාන්ත්‍රණ සම්පාදනය කිරීම මගින් සියල්ලන්ම අයත් සමාජයක් ගොඩනැංවීමෙහි ලා රජය විසින් යත්න දැරුය යුතුය.

- ශ්‍රී ලාංකේය ජනගහනයෙහි විවිධත්වය විදහා දැක්වෙන පරිදි රාජ්‍ය සේවයෙහි ද අධිකරණ පද්ධතියෙහි ද නියෝජනය සහතික කිරීම.

22/46

- සමස්ත සමාජයෙහි කොටසක් වශයෙන් තමා සිටින බැව් ඒත්තු ගැන්වෙන පරිද්දෙන් සියලු පුරවැසියන් වෙත පුරවැසි බව පිළිබඳ අන්තර්ගත ආකල්ප ප්‍රවර්ධනය කිරීම. මෙම මූලිකාංග තුලින් තමන්ගේ දුක් ගැනවිලි වලට සවන් දෙන ක්‍රමයක් ව්‍යවස්ථාදායකය හරහා සිදුවෙමින් වන්දි ගෙවීමක් සිදුවන බවත් ඒත්තු ගැන්විය යුතු අතර එමගින් නව ගැටුම් බිහිවීම සහ නැවත ප්‍රචණ්ඩත්වය කරා යාම වැලකිය යුතුය.

- කාන්තා - ගෘහ මූලිකයන්, යුධ වැන්දඹුවන්, ලිංගික හා පුමිතිරිබව - පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙන් මුදවන ලද්දවුන්, ළමුන් හා තාරුණ්‍යය, අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූ ප්‍රජාවන්, අතුරුදන් වූ සහ විතැන් වූවන්ගේ පවුල්, පෙර යුධ සටන්කාමීන් සහ සොල්දාදුවන් ගේ පවුල්, ආබාධිත, නැවත පදිංචි කරවූ ප්‍රජාවන්, වෙත සීමා නොවී ඔවුන්ද ඇතුළුව, අර්බුදයෙන් බලපෑමට ලක් වූ අවදානම් මට්ටමෙහි සිටින කණ්ඩායම් වල අවශ්‍යතා, බලගැන්වීම්, සහ ඔවුන් පිළිබඳ සොයා බැලීම් වලට අවධානය යොමු කළ යුතු වේ.

හිමිකාරීත්වය

- ශ්‍රී ලංකාවෙහි සිටින්නවුන්, එතෙර වෙසෙන ශ්‍රී ලාංකිකයන් සහ ශ්‍රී ලාංකේය සම්භවයක් සහිත සියලු ප්‍රජාවන්ට අයත් එතෙර වෙසෙන්නවුන් යන සියල්ලන් සංවර්ධනයට මෙන්ම සංහිඳියාවට සහ සහජීවනයට සක්‍රියව දායක කර ගැනීමේ අභිලාශයෙන් යුතුව යම් පාලනයකින් යුතුව සහාය කොට ගැනීම.

- සංහිඳියාව සහ සහජීවනය යන ක්‍රියාවලීන් හි, අත්‍යවශ්‍ය පාර්ශවකරුවන් ලෙස තීරණ ගැනීමේ ව්‍යුහයන්හි සහභාගී කර ගැනීම හරහා කාන්තා සහ තුරුණු ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම.

- ප්‍රගතිශීලී සහ සාධාරණ තත්ත්වයන් යටතේ සහජීවනයෙන් යුතුව මෙම බාධක පිළිබඳව කටයුතු කිරීම සඳහා තමන්ගේ හිමිකම් වලට සහභාගී වීම සහ ඒ අනුව කටයුතු කිරීම මෙන්ම නිර්වචනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා, සියලු ප්‍රජාවන්ට අයත් අදාල පාර්ශවයන්, ඒවාට සීමා නොවන මුත් ඒවාද ඇතුළුව එනම් ගෘහ ඒකකයන්හි කාන්තා - ගෘහ මූලිකයන්, යුධ වැන්දඹුවන්, ළමුන් හා තාරුණ්‍යය, අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූ ප්‍රජාවන්, අතුරුදන් වූ සහ විතැන් වූවන්ගේ පවුල්, පෙර යුධ සටන්කාමීන් සහ සොල්දාදුවන්, ආබාධිත, නැවත පදිංචි කරවූ ප්‍රජාවන්, සමාජයීය වශයෙන් කොන් කරන ලද්දවුන්, සහ එතෙර වෙසෙන ශ්‍රී ලාංකිකයින් මෙන්ම සියලු ප්‍රජාවන්ට අයත් එතෙර වෙසෙන ශ්‍රී ලාංකේය සම්භවයක් ඇති පුද්ගලයන් විසින් වෙන් වෙන් වශයෙන් මුහුණ දෙනු ලබන බාධාවන් පාලනයකින් යුතුව පරීක්ෂාවට ලක් කිරීම.

යුක්තිය සහ නීතියේ රජයුම / අධිපාලනය

- මනාව හැසිරවිය හැකි වූ ද අවලම්භිත වූ ද යුක්තිය සාක්ෂාත් කර ගැනීමෙහි ලා යෝග්‍ය පරිදි සම්පාදනය කිරීම, සහ ප්‍රවේශයට අවකාශ ලබා දීම පිණිස නෛතික පද්ධතිය, අවශ්‍ය අවස්ථාවක දී ශක්තිමත් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.

- සමාන සහ දැනුවත් වූ යුක්තියට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් ක්‍රියාකාරීව කටයුතු කිරීම, නීතිය හා නෛතිකත්වය පවත්වා ගැනීම, මෙන්ම සාධාරණ, අපාර්ශ්වික, සාර්ථක සහ පහසු යුක්තිය අපාර්ශ්වික සහ පරිමිත අධිකරණයක පරිද්දෙන් යුක්තිය පටිපාටිගත කිරීම.

- අර්බුදයෙහි ප්‍රතිඵලයක් ලෙස පීඩාවටත් අහිමි වීමටත් ලක් වූවා යැයි හඳුනාගන්නා ලද වින්දිතයන් වෙත වන්දි ගෙවීම සඳහා සෑම ප්‍රයත්යක්ම දැරීම, මෙන්ම යුක්තිය සහ වන්දි ගෙවීමේ මාර්ගයෙහි ගමන් කිරීමේ දී හා ඉන් අනතුරුව වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම.

- යම් මිනිස් කොට්ඨාශයක් පහත් කොට සලකනු ලබන සහ ප්‍රාමාණික ප්‍රමිතීන් හි නොපිහිටනු ලබන නීති සංශෝධනය කිරීම සහ සමාලෝපනය / අහෝසි කිරීම; සහ සංහිඳියාව සඳහා අනුබල දීමට අවශ්‍ය වන නීති හඳුන්වා දීම.

- නීතිය ඉදිරියේ සියල්ලන් ම සමාන වන සමාජයක් ගොඩනැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- සමස්තයක් ලෙස පුරවැසියන්ගේ ජීවිත වලට සාමාන්‍ය ජීවන රටාවක් සහ අභිමානයක් ලබා දීමට ශක්‍යතාවක් ලබා දෙමින් ද ප්‍රචණ්ඩත්වයේ සහ අර්බුදයෙහි වින්දිතයන් වෙත විශේෂයෙන්ම ශක්‍යතාව ලබා දෙමින්, සංහිඳියාව පිළිබඳ ස්ථාපිතයන් ගොඩනංවන විට ආර්ථික යුක්තියෙහි බලපෑම් සහතික කිරීම.

- සමාජයන් හි සහ ප්‍රජාවන් හි - මැදහත්වීමට සහ තීරකකරණය / බෙරුම්කරණය යන කරුණු වලට පමණක් සීමා නොවී එයද ඇතුළුව - දේශීය මට්ටමේ යුක්තිය පවත්නා වූ ද වන්දි යාන්ත්‍රණ පවත්නා වූ ද මට්ටම් පිළිබඳව නිරීක්ෂණය කිරීම, සහ අනුගත කරගත හැකි එහෙත් ශක්‍යතාවෙන් අඩු වූ ද ප්‍රතිචලිත වූ ද ඒවා ශක්තිමත් කිරීමට පියවර ගැනීම.

- පුරවැසියන් ගේ දුක් ගැනවිලි සහ අභිලාශයන් වලට සවන් යොමු කරන සංස්කෘතියක් ගොඩනැංවීම උදෙසා රාජ්‍ය ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ එමගින් සාර්ථකව ප්‍රතිචාර දැක්වීමට ඇති රාජ්‍යයේ හැකියාව වර්ධනය කිරීම.

- පරිපාලන ප්‍රතිසංස්කරණ, අධිකරණ ප්‍රතිසංස්කරණ, සහ ආරක්ෂක අංශයේ - ප්‍රතිසංස්කරණ ඇතුළත්, ගැටුම් නැවත ඇති නොවීම සහතික කිරීමේ ඉලක්ක පෙරදැරි කරගත් ප්‍රතිසංස්කරණ.

**තිරසාර සංවර්ධනය**

- සංවර්ධනයට හිමිකම් - මත පදනම් වූ ප්‍රවේශයක් ලබා ගැනීමට පිළිගත් ප්‍රතිපත්ති මගින් සියලු සංවර්ධන ක්‍රියාවලීන් වලට සහයෝගය ලබා දීමට සිදුවන බව අවධාරණය කිරීම.

- සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීමෙහි දී හානියට පත් වූ ප්‍රජාවන්, කාන්තාවන් සහ තරුණ ප්‍රජාව ඒ සඳහා සක්‍රීයව දායක කර ගැනීම සහතික කිරීම.

24/46

- විශේෂ සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති හේතුවෙන් බලපෑමට ලක් විය හැකි ප්‍රජාවන් ගේ උපදේශනය සහ දායකත්වය ලබා ගැනීමට සහතික වීම.

- ශ්‍රී ලංකාව තුල සහජීවනය, ඒකාබද්ධතාව, ජාතික සාමය හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා අනිවාර්ය අධ්‍යාපනය සමඟ අනුගත වෙමින් සියලු දිස්ත්‍රික්කයන්හි ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික මට්ටම් වල අධ්‍යාපනය ප්‍රශස්ත මට්ටමින් පවතින බවට සහතික වීම පිණිස සෑම ප්‍රයත්නයක්ම දැරීම රාජ්‍යය විසින් සිදුකළ යුතුය.

- සමාන මට්ටමින් රටෙහි සියලු කලාප සහ ප්‍රජාවන් හි සාධාරණ සංවර්ධනයක් සහතික කිරීම.

**ප්‍රජා සවිඥානකතාව**

- ශ්‍රී ලංකාව තුල තිරසාර සාමය, සමාජ ඒකාබද්ධතාව සහ සංහිඳියාව සාක්ෂාත් කර ගැනීමෙහි ලා සමාන පාර්ශවකරුවන් ලෙස හිමිකම් හා වගකීම් ධනාත්මකව අන්තර් ක්‍රියාකාරී කිරීම ප්‍රමුඛ කොට ගැනීම සඳහා වෙනස්කම් වලට ගරු කෙරෙන්නා වූත් ස්මරණය කරන්නා වූත් සහයෝගීතාවක් සහ සංස්කෘතියක් ගොඩනගා ගැනීම, සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක වන ප්‍රජාතාන්ත්‍රවාදයක් සහතික කිරීම සඳහා ඔවුන්ගේ වගකීම සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලාංකේය පුරවැසියන් අතර වගකීම්සහගත බව රෝපනය කිරීම.

- ක්‍රියාවලියෙහි සිටින පුරවැසියන් දැනුම්වත් කිරීම තුලින් සහභාගීත්වය සහතික කිරීම සඳහා පවත්නා පොදු අධ්‍යාපනය මගින් සංහිඳියාව පිළිබඳ මූලිකාංග සහතික කිරීම.

- පුරවැසියන්ගේ ආර්ථික, සංස්කෘතික සහ දේශපාලනික ඇතුළු ජීවිතයෙහි සියලු තලයන් පුරා පැතිර යන මධ්‍යස්ථබව පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට ප්‍රගාමී පියවර ගැනීම.

**සංක්‍රාන්ති යුක්තිය**

- සත්‍ය සෙවීම සහ සුවවීම; යුක්තිය; අතුරුදන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල් වල හිමිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම; වන්දි ගෙවීම සහ සංක්‍රාන්ති යුක්තියෙහි සාධක ලෙස ආයතනික ප්‍රතිසංස්කරණ පුනරුක්තියක් - නොවීම වැනි පුළුල් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීම වෙනුවෙන් සංහිඳියාව සහ සහජීවනය සම්බන්ධ වන බව හඳුනා ගනිමින්, මෙකී සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණ ක්‍රියාත්මක වීමෙහි කාලය සඳහා වින්දිතයන් සහ වින්දිත ආයතන, ආගමික නායකයන්, දේශපාලනික නියෝජිතයන් සහ සිවිල් සමාජයෙහි අඛණ්ඩ උපදේශකත්වය සහ සහභාගීත්වය සමඟ පුළුල් උපදේශාත්මක ක්‍රියාවලීන් සහ ක්‍රියාකාරීත්වය සමඟ ස්ථාපිත වූ ස්වාධීන, ඉලක්කගත, විශ්වාසනීය, යෝග්‍ය පරිදි සම්පත් දායක කරගනු ලැබූ යාන්ත්‍රණ හරහා මෙම ප්‍රගමනයන් සාක්ෂාත් කර ගැනීමට රජය විසින් සෑම උත්සාහයක්ම දැරිය යුතුය.

## 6. හරස් ආංශීය මූලධර්ම

සංහිඳියාව හා සහජීවන වැඩසටහන් හා ක්‍රියාකාරකම් සැලසුම් කරන්නා වූ හා ක්‍රියාත්මක කරන්නා වූ සියළුම පාර්ශවකරුවන්ට අදාළ වන්නා වූ සංහිඳියා ක්‍රියාමාර්ග සැලසුම් කිරීම සම්බන්ධයෙන් වන මූලධර්ම මාලාවක්.

**ගැටුම් පිළිබඳ සංවේදීතාව**

සංහිඳියාව හා සහජීවන කටයුතුවලට මැදිහත්වීම තුලින් ගැටුම් ඇති කිරීම හෝ උග්‍ර තත්ත්වයට පත් කිරීම නොව ඒවා මර්දනය කිරීමක් සිදු වන බව තහවුරු කිරීම. එම කටයුතුවලට මැදිහත්වීම තුලින් ඇති වන සාධනීය හා නිෂේධාත්මක බලපෑම්, එම මැදිහත්වීම් සිදු කරන්නා වූ සන්දර්භය, හා එම මැදිහත්වීම් තුලින් සන්දර්භය තුල ප්‍රතිලෝම වශයෙන් ඇති විය හැකි බලපෑම් පිළිබඳ ක්‍රමවත්ව අධ්‍යයනය කිරීම මෙයට ඇතුලත්ය.

**සංස්කෘතික අවබෝධය**

සියළුම සංහිඳියා ක්‍රියාමාර්ගවලට හිතකර අයුරින් එක් එක් සංස්කෘතීන්වලට ඒ ඒ සංස්කෘතික වටිනාකම්, අදහස් හා චර්යා සඳහා දායකත්වය ලබා දිය හැකි පරිසරයක් නිර්මාණය කිරීම තුලින් ක්‍රමෝපායික හා ක්‍රියාත්මක මට්ටමේ සංස්කෘතික අවබෝධයක් ඇති කිරීම සඳහා ප්‍රයත්න ශක්තිමත් කිරීම.

**උවදුරට ලක්වූවන් කෙරෙහි කේන්ද්‍රීයවීම**

සියළුම සංහිඳියා ක්‍රියාමාර්ග තුලින් උවදුරුවලට පත් වූ පුද්ගලයින්ගේ අයිතිවාසිකම්, අවශ්‍යතා හා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන බවත් උවදුරුවලට පත් පුද්ගලයින්ගේ නියෝජ්‍යත්වය ප්‍රවර්ධනය කරන ආකාරයෙන් එම ක්‍රියාමාර්ග සැලසුම් කරන බවත් තහවුරු කිරීම සහ හුදෙක් ප්‍රතිපත්ති හා ප්‍රතිලාභීන් යන කරුණුවලින් ඔබ්බට ගොස් උවදුරට පත් වූවන් පිළිබඳ සලකා බලන බව තහවුරු කිරීම. මෙයින් අදහස් වනුයේ සංහිඳියාව හා සහජීවන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන කාලය පුරාවටම උවදුරට පත් වූවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ද සිදු වන බව තහවුරු කිරීමයි.

**ස්ත්‍රී පුරුෂ අදාළත්වය**

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී හා සංහිඳියාව හා සහජීවන ක්‍රියාමාර්ග සැලසුම් සකස් කිරීමේ සෑම පියවරකදීම කාන්තාවන්ගේ මානව අයිතිවාසිකම් ගෞරවයට, ආරක්ෂාවට ලක්වන පරිදි හා ඒවා ඉටු වන පරිදි ස්ත්‍රී පුරුෂභාවය අදාළ කර ගන්නේ ද යන්නත් සියළු සංහිඳියා ක්‍රියාමාර්ග තුලින් කාන්තා හා පිරිමි පාර්ශ්වයන් අතර ගෞරවනීයත්වය සුරැකෙන සංස්කෘතියක් ගොඩනැගීම හා ගැටුම් හා ප්‍රචණ්ඩත්වය හේතුවෙන් කාන්තාවන් විශාල සංඛ්‍යාවක් උවදුරට පත්ව සිටින බවත් ඒ සඳහා විසඳුම් ලබා දිය යුතු බවත් ඔවුන් යථා තත්තවයට පත් කළ යුතු බවත් හඳුනා ගනිමින් ප්‍රතිපත්ති හා සහජීවන ක්‍රියාවලිය තුල ඔවුන්ට සමාන ක්‍රියාකාරී සහභාගීත්වයක් හිමි විය යුතු අතර ඔවුන්ගේ දායකත්වය හා සහභාගීත්වය අභිමානවත්ව ලබා දීම සඳහා අවස්ථාව සැලසෙන බව ප්‍රගාමීව සොයා බැලීම.

### කාර්යක්ෂමතාව හා ඵලදායිතාව

සංහිඳියාව හා සහජීවන මැදිහත්වීම් සඳහා වන ප්‍රමුඛ අවශ්‍යතාවන්ට අනුව සම්පත් සාධනීය ලෙස යොදවන බව හා වඩාත් උචිත ප්‍රවේශයන් උපයෝගී කර ගන්නාබව තහවුරු කිරීම. ඒ අතරතුර එවැනි ක්‍රියාමාර්ග තුලින් හඳුනාගත් කණ්ඩායම් අතර අපේක්ෂිත බලපෑම ඇති වන බවට අවධානයෙන් පසු වීම.

### සම්බන්ධීකරණය සහ අනුපූරකතාව

සාකල්‍ය, සමෝධාන හා ඒකාබද්ධ සංහිඳියා ප්‍රයත්නයන් ශක්තිමත් කළ හැකි පරිදි පාර්ශ්වකරුවන් එකිනෙකා අතර හා රජය තුල හා රජයෙන් බාහිර සම්බන්ධීකරණ කටයුතු පවත්වා ගැනීමට හැකි සෑම උත්සායක්ම දැරීම සහ ප්‍රතිසන්ධාන ක්‍රියාමාර්ග හුදකලාව ක්‍රියාත්මක කිරීමෙන් වැළකීම සහ ඒ වෙනුවට අන්‍යොන්‍ය වශයෙන් සිදුවන සමාජ බලපෑම හා අන්‍යොන්‍ය පෝෂණය ඉහළ නැංවීමට හැකි වන ආකාරයෙන් සංහිඳියාව හා සහජීවන ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම.

### නායකත්වය හා තිරසාරත්වය

ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය තුල ප්‍රතිසන්ධානය උදෙසා තීරණාත්මක හා නවමු ප්‍රවේශයක් අනුගමනය කිරීම සඳහා පාර්ශ්වකරුවන් බලගැන්වීම, සහ ප්‍රජා නායකයින් හා උවදුරට, පීඩාවට හා ආන්තීකරණයට ලක් වූ ප්‍රජා නියෝජනය ඇති කිරීම සහ ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස් නියෝජනය කරන ක්‍රියාකාරීන් අතුරින් නායකයින් තෝරා ගන්නා බව තහවුරු කිරීම, ප්‍රවීණත්වය හා ඒකාග්‍රතාව විදහා දැක්වීම, මහජන විශ්වසනීයත්වය පැවතීම හා සමාජ දායකත්වය සම්බන්ධයෙන් විශ්වසනීයත්වය ඇති කර ගෙන තිබීම, සමාජයක් තුල සම්පත් සවිබල ගැන්විය හැකි තිරසාර හා ශක්තිමත් යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා සියළුම ප්‍රතිසන්ධාන ක්‍රියාමාර්ග තුල සහයෝගී ධාරිතාවන් ඇති කිරීම, හා සාරධර්ම පිළිබඳ සංස්කෘතියක් හා පුරවැසි සේවාවක් ප්‍රවර්ධනය කළ හැකි නව මූලධර්ම හා නායකත්වයක් ඇති කිරීම.

### දූරදර්ශීබව හා නවෝත්පාදනය

පවත්නා ජාතික හා තුලනාත්මක අත්දැකීම් සුවිශේෂී පසුබිමකට ගැලපෙන පරිදි සකස් කිරීමට හැකි වන ආකාරයේ ප්‍රතිසන්ධාන ප්‍රයත්න සැලසුම් කිරීම සඳහා නිර්මාණාත්මක ක්‍රම ගොඩනැගීම, ඒකාබද්ධ කිරීම හා ස්ථාපිත කිරීම සහ ගැටුම්වල චිත්තවේගීය හා මානසික අංශ විසඳීමට අවකාශය සැලසිය හැකි නවමු ක්‍රම සොයා බැලීම සහ ප්‍රතිසන්ධාන හා සහජීවන ක්‍රියාමාර්ග සැලසුම් කිරීමේ දී ඇති විය හැකි නව හෝ වර්ධනය වෙමින් පවතින ගැටුම් වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

### පැහැදිලි සහ ගැලපෙන සන්නිවේදනය

අදාල පාර්ෂවකරුවන්ගේ උපදේශකත්වයෙන් සහ සහභාගීත්වයෙන් යුතුව සංහිඳියාව පිළිබඳ මැදිහත් වීම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, සහ සිවිල් සමාජයද ඇතුලුව එක් එක් පාර්ශවකරුවන්ට සවන් දීම, ගැටුම් සහ ප්‍රචණ්ඩත්වයෙහි ඍජු හා වක්‍ර වින්දිතයන්, සහ අනෙකුත් බලපෑමට පත් කණ්ඩායම්; රටෙහි සංහිඳියාව කරා ප්‍රගතිය පිළිබඳ තොරතුරු පාලනයකින් යුතුව නිදහස් කිරීම රජය විසින් කළ යුතු අතර පුරවැසියන් වෙත එබඳු තොරතුරු වගකීමෙන් යුතුව සහ ප්‍රවේශ විය හැකි ලෙස පවතිමින්, විවෘතව සහ විනිවිදභාවයෙන් යුතුව සන්නිවේදනය කළ යුතුය. ගැටුම් තත්ත්වයන්හි මූල - හේතුවට විකල්ප ලැබීමට සහ පිළිගැනීමට පුරවැසියන්ගේ සූදානම් බව සහ සැලසුම්සහගත බව ඇතිකර ගැනීමට පහසුකම් සලසන ධනාත්මක චර්යාත්මක වෙනස ඇති

කරලීම, සාම්ප්‍රදායික් සහ සාම්ප්‍රදායික නොවන මාධ්‍ය කැඳවා පුහුණු කිරීම හරහා, සාමාන්‍ය ජනතාව යෙදවීමට රජය විසින් සහයෝගයෙන් යුතුව ප්‍රයත්න දැරිය යුතු වේ.

## 7. ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය

පහත දැක්වෙන උපාය මාර්ග භාවිතා කරමින් සංහිඳියාව සහ සහජීවනය පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වනු ඇත:

1. සංහිඳියාව සහ සහජීවනය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් වර්ධනය කිරීම.

2. වාර්ගික, ආගමික, වාග් විද්‍යාත්මක, සමාජයීය, දේශපාලනික සහ ආර්ථික සාධක හේතුවෙන් ශ්‍රී ලාංකේය සමාජය තුල පවත්නා ස්වාධීනත්වය නිසා වර්ෂ ගණනාවක් තිස්සේ නොවැදගත් සේ සලකමින් කොන් කර ඇති ඛාණ්ඩ හඳුනා ගැනීම.

3. සංහිඳියාව සහ සහජීවනය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුල නොවැදගත් සේ සලකමින් කොන් කරන ලද්දවුන් සඳහා ධනාත්මක ක්‍රියාකාරී වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

4. සංහිඳියාව සහ සහජීවනය මෙන්ම ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීමේ සහ ඒ පිළිබඳව අධ්‍යාපනය ලබාදීමේ වැඩසටහන් දියත් කිරීම.

5. වාර්ෂික වැඩ සැලසුම් හරහා රජයේ ආයතන සහ පවත්නා ජාතික ස්ථාපිතයන් තුල සංහිඳියාව සහ සහජීවනය පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තියෙහි අගනාකම් මුඛ්‍ය ධාරානුගත කිරීම.

## 8. ක්‍රියාත්මක කිරීමේ ආයතන

**සංහිඳියාව සහ සහජීවනය පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය පහත සඳහන් ආයතන මගින් ක්‍රියාත්මක වනු ඇත:**

1. ජාතික ඒකාබද්ධතාව, සංහිඳියාව සහ තිරසාර සාමය රට තුල ස්ථාපිත කිරීමෙහිලා ප්‍රවර්ධනය කරනු වස්; සංහිඳියාව ස්ථාපිත කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම; සහ ගැටුම් නැවත ඇති නොවීම සහතික වී සඳහා වන ක්‍රියාමාර්ග ඔස්සේ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සහ ජාතික සමගිය ඇති කරලීම සඳහා වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම යන අරමුණු පෙරදැරිව 2015.09.21 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයෙන් ස්ථාපිත කරන ලද්දා වූ ජාතික සාමය සහ සංහිඳියාව පිළිබඳ කාර්යාලය (ONUR) අයත් වන *ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය*

2. (අ) භාෂා ප්‍රතිපත්තිය සහ නීතිය සංවර්ධනය කිරීම, භාෂා නීතිය උල්ලංඝනය කිරීම පිළිබඳව මෙහෙයවීම සහ නෛතික ඇතුළුව නිවැරදි කිරීමේ පියවර ගැනීම, රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් තුල ජාතික භාෂා සහ සබැඳි භාෂාව භාවිතා කිරීම සඳහා අවැසි වන පහසුකම් සැපයීම, අවශ්‍යතාව සහිත වූවන්ට භාෂා ඉගැන්වීම, භාෂා පරිවර්තකයින්, භාෂණ පරිවර්තකයින් ගුරුවරු, පුහුණු කරන්නන් පුහුණු කිරීම, භාෂා පාඨමාලා සඳහා විභාග සංවිධානය කිරීම (ආ) "ශ්‍රී ලාංකිකයා - අපගේ අනන්‍යතාව; විවිධත්වය - අපගේ ශක්තිය" යන අමාත්‍ය මණ්ඩලීය පාඨ්‍ය මත පදනම් වූ විවිධ අනන්‍යතා සමඟ ප්‍රජාවන් අතර සහජීවනය ස්ථාපිත කිරීම පිණිස ජාතික සංවාද අන්තර් ක්‍රියා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ඇ) සිවිල් සමාජයීය සංවිධාන (CSO) සහ ස්වේච්ඡා සංවිධානයන්හි ජාතික ජලය ගොඩනැංවීම, ධාරිතා සංවර්ධනය පිළිබඳව සිවිල් සමාජයීය සංවිධාන (CSO) සඳහා සහාය දැක්වීම, ජාතික ප්‍රමුඛතා හඳුනා ගැනීම සඳහා සහාය ලබා දීම, අන්තර්ජාතික ස්වේච්ඡා සංවිධාන වල සහභාගීත්වය සඳහා පහසුකම් සැලසීම සඳහා සහජීවන සංවාද අධ්‍යක්ෂ කාර්යාලය (CDD), භාෂා හිමිකම් අධ්‍යක්ෂ කාර්යාලය (LRD), රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව (DOL), රාජ්‍ය භාෂා කොමිසම් සභාව (OLC), භාෂා අධ්‍යාපන සහ පුහුණු ජාතික ආයතනය (NILET), රාජ්‍ය නොවන සංවිධානයන්හි ජාතික ලේකම් කාර්යාලය (NS-NGO) යන ආයතන පවත්නා වූ 2015.09.21 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ස්ථාපිත කරන ලද්දා වූ ***ජාතික සහජීවනය පිළිබඳ සංවාද සහ රාජ්‍ය භාෂා අමාත්‍යංශය***

3. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා 2015.09.21 දිනැතිව නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කරන ලද්දා වූ ***බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යංශය***

4. සත්‍යය සෙවීම, යුක්තිය, වන්දි සහ අතුරුදන් වූ පුද්ගලයන්ගේ හිමිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම යන කරුණු ඇතුළු සංක්‍රාන්ති යුක්තිය සඳහා යාන්ත්‍රණ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා 2015.12.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ස්ථාපිත කරන ලද ***සංහිඳියාව පිළිබඳ යාන්ත්‍රණ සම්බන්ධීකරණය කිරීම සඳහා වන ලේකම් කාර්යාලය***

**END OF DOCUMENT**